# මලිතිගේ අපූරු කුඩය



නෙතන්‍යා මිනෝලි

# මලිතිගේ අපූරු කුඩය

© නෙතන්යා මිනෝලි

ISBN :- 9786242065717

කතාව, පිටකවරය සහ චිත්‍ර :- නෙතන්යා මිනෝලි
මහ/ මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
6 ශ්‍රේණිය A

කතෘගේ වෙනත් කෘති :- මගෙ රට මගෙ පණ වගෙයි
සිරි දළදා පෙරහැර

2023 නොවැම්බර් 20

# පිදුම

"මගේ දූ හරිම දක්ෂයි. ඔයාට පුලුවන්"

කියමින්

සැමදා මා දිරිමත් කළ

දයාබර සමන්මලී ගුරු මෑණියන්ට

හද බැතියෙන්

පුද කරමි.

# පෙරවදන

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත්  බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින්  ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු  පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින්  "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා  සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 . 11 . 01



එකමත් එක කාලෙක පුංචි ගමක ලස්සන
ගැහැණු ළමයෙක් හිටියා. එයාගේ නම මලිති.
මලිති හිටියේ එයාගේ අත්තම්මත් එක්ක.



මලිතිගේ අත්තම්මා එයාට හරිම ආදරෙයි.
මලිතිගේ අටවන උපන්දිනය දවසේ
අත්තම්මා එයාට ලස්සන කුඩයක් තෑගි කළා.



පුංචි මලිති මේ කුඩයට හරි ම ආසයි.
එයා යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න ගියෙත්
කුඩේ අරගෙන. යාළුවොත් ඒ කුඩේට හරිම ආසයි.



එක දවසක් මලිති සෙල්ලම් කරලා ඉවරවෙලා
කුඩයත් ඉහළගෙන හරිම සතුටින්
ගෙදර එන්න පිටත්වුණා.



අතරමග දී එකපාරටම තද සුළඟක් හමන්න පටන් ගත්තා.



පුංචි මලිති සුළඟේ ගහගෙන යන්න පටන් ගත්තා.
එයා හොඳටම බයවෙලා තදින් කුඩේ අල්ලා ගත්තා
මලිති කුඩෙත් එක්කම ඉහළට ගියා.



මලිති ගහගෙන ගිහිල්ලා
ලස්සන වළාකුළක් උඩට වැටුණා.
ඒත් එයා කුඩේ නම් අතහැරියේ නෑ.




පුංචි මලිති වලාකුළ උඩ ඉඳගෙන වටපිට බැලුවා. එයා එකපාරටම තිගැස්සුනා. මලිති ඉදිරියේ තිබුණේ වලාකුළු මාළිගාවයි ලස්සනම ලස්සන දේදුන්නයි. එයාට හරිම පුදුමයි.
පුංචි මලිති ගොඩක් වෙලා මාළිගාව දිහා බලාගෙන හිටියා. එකපාරටම එයාට අත්තම්මා මතක් වුණා.



පුංචි මලිති කුඩේ එල්ලිලා පහළට එන්න පටන් ගත්තා. මලිති පහළට එනවා දැකලා අත්තම්මා පුදුමයෙන් බලාගෙන හිටියා.



මලිති අත්තම්මා ළඟට ඇවිත් තුරුළුවෙලා
සිදුවුණ දේ අකුරක් නෑර කිව්වා.
අත්තම්මාටත් හරිම පුදුමයි. මීට පස්සේ
කිසිම වෙලාවක තනියම ගමන් බිමන් එපා කියලා
අත්තම්මා මලිතිට අවවාද කළා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN 9786242065717